**පේරාදෙණිය විශ්ව විද්‍යාලය**

**දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) අගෝස්තු 2015**

ඉස්ලාම් සංස්කෘතිය I – ( ICG I )

(ඉස්ලාමයේ දේශපාලන ඉතිහාසය)

මෙම ප්‍රශ්න පත්‍රයේ ඇති ප්‍රශ්න සංඛ්‍යාව 08 කි. ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ. අපැහැදිලි අකුරුවලට ලකුණු අඩුකරනු ලැබේ.

( කාලය : පැය 03 කි )

---

01. උමයියා පාලනයේ බිහිවීම පැහැදිලි කොට කලීෆා මුආවියා (රලි) තුමාගේ සේවාව අගය කරන්න.

02. කර්බලා සිද්ධියට තුඩුදුන් පසුබිම විග්‍රහකොට ඉස්ලාම් ඉතිහාසයේ එය ඇතිකළ බලපෑම විමසන්න.

03. කලීෆා වලීද් බින් අබ්දුල් මලික් සමයේ රාජ්‍ය ප්‍රසාරණය ගැන සවිස්තරාත්මකව සටහන් කරන්න.

04. බුවයිහි කුඩා රාජ්‍යයේ බිහිවීම ගැනත් අබ්බාසි කලීෆා සමග පැවති සබඳතා ගැනත් විග්‍රහ කරන්න.

05. අබ්බාසි පරිපාලනය හා සම්බන්ධව පහත මාතෘකා විස්තර කරන්න
    - අ. නීති පරිපාලනය
    - ආ. දෙපාර්තමේන්තු
    - ඇ. හමුදාව
    - ඈ. ආදායම් සහ වියදම්

06. මුස්ලිම් ස්පාඤ්ඤයේ සංවර්ධයේ දී තුන්වන කලීෆා අබ්දුර් රහ්මාන් තුමාගේ දායකත්වය විවරණය කරන්න.

07. බයිතුල් මුකද්දිස් නැවත අල්ලාගැනීමේදී සුල්තාන් සලාහුද්දීන් අයියූබ්ගේ දායකත්වය සහ එහි සාමය ස්ථාපිත කිරීමට ඔහු පෙන්වාදුන් ආදර්ශයන් පැහැදිලි කරන්න.

08. සංක්ෂිප්ත සටහන් ලියන්න
    - අ. හජ්ජාජ් බින් යූසුෆ්
    - ආ. අබ්බාසි පාලනයෙහි බර්මිකිවරුන්
    - ඇ. කලීෆා ම ඃ මූන්
    - ඈ. බැග්ඩෑඩ් නගරීකරණය

පේරාදෙණිය විශ්ව විද්‍යාලය
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) අගෝස්තු 2015
ඉස්ලාම් සංස්කෘතිය II– ( ICG II )
(විශ්වාසයන් ගේ මූලධර්ම සහ ආංශික සංවර්ධනය)

මෙම ප්‍රශ්න පත්‍රයේ ඇති ප්‍රශ්න සංඛ්‍යාව 08 කි. ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ. අපැහැදිලි අකුරුවලට ලකුණු අඩුකරනු ලැබේ.
( කාලය : පැය 03 කි )

---

01. සමාජ ප්‍රාග්ධනයක් ලෙස සකාත් හි අවශ්‍යතාවය සඳහන්කොට එහි සමාජයීය ඵලදායිතාවය විවරණය කරන්න.

02. කලා-කද් ර් සංකල්පය කෙටියෙන් පැහැදිලි කොට මිනිස් ක්‍රියාවල නිදහස පිළිබඳ ඉස්ලාමික චින්තනය පැහැදිලි කරන්න.

03. තසව්වුෆ් කලාව ඉස්ලාම් ලෝකයේ බිහිවීම හා වර්ධනය පැහැදිලිකොට පසුකාලීනව එය නියම මාර්ගයෙන් වෙනස් වීමට හේතූන් විමර්ශනාත්මකව විමසන්න.

04. කෙටි සටහන් ලියන්න
    අ. ඉමාම් අබුල් හසන් අස්සාදුලි (රහ්)
    ආ. කත්මුන් නුබුව්වත්
    ඉ. රසාඉල් ඉඛ්වානුස්සෆා
    ඊ. කාරිජ් වරු

05. අහ්ලුල් ෂියා යන්නන් කවරහුද ? ෂියා සංකල්පය පැහැදිලිකොට ෂියා-අහලුස්සුන්නා අතර වෙනස පැහැදිලි කරන්න.

06. ඉස්ලාම් විශ්වාසයේ සර්වබලධාරී අල්ලාහ් කෙරෙහි විශ්වාසයෙහි වැදගත්කම සඳහන් කොට තව්හීද් මුස්ලිමෙකුගේ ජීවිතයේ ඇතිකරන බලපෑම් විවරණය කරයන්න.

07. ආදර්ශමත් සමාජයක් බිහිකිරීටම රිසාලත් හි අවශ්‍යතාවය තර්කාන්විතව විමසන්න.

08. 'ඉස්ලාම් ඇදහිලි මිනිස් සමාජයේ ආදර්ශමත් සමාජයක් ලෙස ජීවත්වීමට මගපෙන්වයි' නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

# පේරාදෙණිය විශ්ව විද්‍යාලය
## දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) අගෝස්තු 2015**
**ඉස්ලාම් සංස්කෘතිය III– ( ICG III )**
**(මුස්ලිම් විද්‍යාවන් සහ ලලිත කලාවන්)**

මෙම ප්‍රශ්න පත්‍රයේ ඇති ප්‍රශ්න සංඛ්‍යාව 08 කි. ඕනෑම ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමිවේ.

( කාලය : පැය 03 කි )

---

01. 'මිනිස් ශිෂ්ඨාචාරයට පදනම් වූ විද්‍යාත්මක දියුණුව සහ ඒවායෙහි විශ්මිත සොයාගැනීම්වලටත් පදනම සකස්කළේ මධ්‍යතන යුගයේ මුස්ලිම් විද්වතුන් වේ' විමසන්න.

02. ගණිත ක්ෂේත්‍රය මුස්ලිම්වරුන් ගේ ප්‍රියතම ක්ෂේත්‍රයක් ලෙස පැවතීමට හේතුවූ කරුණු සඳහන්කොට එම ක්ෂේත්‍රයට දායකවූ මුස්ලිම් ගණිතඥයන් දෙදෙනෙකු ගැන අගැයීමක් කරන්න.

03. අබ්බාසි රාජ්‍ය පාලන සමයේ මුස්ලිම් වරු තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ සිදුකරන ලද සේවාවන් ගැන විමර්ශනයක් කරන්න.

04. වාදනය සම්බන්ධව ඉස්ලාමීය ස්ථාවරය සඳහන්කොට මධ්‍යතන යුගයේ එහි වර්ධනය ගැන පිරික්සන්න.

05. මුස්ලිම්වරුන්ගේ විද්‍යාත්මක ක්ෂේත්‍රය කඩාවැටීමට තුඩුදුන් හේතූන් පැහැදිලි කරන්න.

06. ඉස්ලාමීය ඉතිහාස ක්ෂේත්‍රය බිහිවීම, වර්ධනය හා එහි විශේෂාංග ගැන සඳහන් කරන්න.

07. මුස්ලිම්වරු අධික ලෙස ආකර්ශනය කරගත් ලේඛන කලාවේ බිහිවීම හා වර්ධනය ගැන සඳහන් කරන්න.

08. පහත මාතෘකා දෙකක් ගැන පැහැදිලි කරන්න
    අ. ලලිත කලාව සහ ඉස්ලාම්
    ආ. මුල්කාලීන මුස්ලිම්වරුන්ගේ කලා ආයතන
    ඇ. විද්‍යා ක්ෂේත්‍රයට අල්කුර්ආනය දරන වැදගත්කම
    ඇ. අධ්‍යාපන ක්ෂේත්‍රයට උමයියාවරුන්ගේ දායකත්වය